**ශීර්ෂ 142- ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට එක් එක් ශිර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

**1.** **අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| **ශීර්ෂ** | **දෙපාර්තමේන්තුව** |
|---|---|
| 207 | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව |
| 208 | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව |
| 209 | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව |

1.1 **විගණන විෂය පථය**

ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ හා එම අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවල 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තා පහත සඳහන් දිනවල එම අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවල ප්‍රධාන ගණන්දීමේ නිලධාරීට හා ගණන්දීමේ නිලධාරීන් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

| **ශීර්ෂ** | **අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව** | **කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කළ දිනය** |
|---|---|---|
| 142 | ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය | 2015 ඔක්තෝබර් 28 |
| 207 | පුරා විද්‍යා දෙපාර්තමේන්තුව | 2015 ඔක්තෝබර් 19 |
| 208 | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව | 2015 ඔක්තෝබර් 28 |
| 209 | ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව | 2015 ඔක්තෝබර් 19 |

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

2. **ගිණුම්**

2.1 **විසර්ජන ගිණුම්**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 03 ක් සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.1,584,384,200 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.1,510,447,680 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා එක් එක් දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.5,079,541 ක සිට රු.45,818,650 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 1.94 ක සිට සියයට 13.90 ක් දක්වා පරාසයක පැවතුණි. විස්තර පහත දැක්වේ.

| **ශීර්ෂ** | **2014 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | රු. | රු. | රු. | |
| 142 | 329,620,000 | 283,801,350 | 45,818,650 | 13.90 |
| 207 | 830,835,200 | 814,738,537 | 16,096,663 | 1.94 |
| 208 | 252,982,000 | 246,040,334 | 6,941,666 | 2.74 |
| 209 | 170,947,000 | 165,867,459 | 5,079,541 | 2.97 |
| **එකතුව** | **1,584,384,200** | **1,510,447,680** | **73,936,520** | **4.67** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම්.**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 03 කට අදාල රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **විෂය අංකය** | **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|---|
| | **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 14201 | 5,000,000 | 4,932,286 | 1,700,000 | 4,077,464 | 25,000,000 | 11,528,043 |
| 20701 | 42,000,000 | 38,037,570 | 22,000,000 | 25,827,678 | 140,000,000 | 100,333,823 |
| 20801 | 12,000,000 | 11,843,728 | 4,500,000 | 7,118,041 | 40,000,000 | 28,124,786 |
| 20901 | 6,000,000 | 5,710,518 | 2,600,000 | 4,847,881 | 27,000,000 | 15,505,464 |

**2.3 අග්‍රිම ගිණුම**

අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 02 ක 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ එකතුව රු.2,862,240 ක් විය. විස්තර පහත දැක්වේ.

| **අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව** | **අග්‍රිම ගිණුම් අංකය** | **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|---|
| | | රු. |
| පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | 7002/0000/00/0150/0013/000 | 939,036 |
| ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව | 7002/0000/00/0151/0013/000 | 1,923,204 |
| **එකතුව** | | **2,862,240** |

**2.4 පොදු තැන්පත් ගිණුම්**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 03 ක 2014 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු. 179,938,605 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | පොදු තැන්පත් ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය | 6000/0000/00/0015/0183/000 | 954,894 |
| පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0089/000 | 156,709,834 |
| ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0091/000 | 15,005,839 |
| ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0090/000 | 7,268,038 |
| **එකතුව** | | **179,938,605** |

## 2.5 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවල විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරික්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවල සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ වාර්තාවල ඇතුළත් නිරික්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සිට 6 ඡේදය දක්වා වූ ඡේදවල දක්වා ඇත.

## 3. ශීර්ෂ 142 - ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය.

### 3.1 අයවැය විචලනය

වැය විෂයයන් 12 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම නිසා එම වැය විෂයන්වලින් උපයෝජනය කළ පසු ඉතිරිය, ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 29 සිට සියයට 74 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### 3.2 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

2013 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පරිගණක සටහන් අනුව රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හර ශේෂය හා අමාත්‍යාංශයේ රජයේ නිලධාරීන්ට ණය හා අත්තිකාරම් පාලන ගිණුමෙහි හර ශේෂය අතර රු.1,000,627 ක වෙනසක් පැවතුණි.

**3.3 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|
| | රු. | |
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| (i) IV වන පරිච්ඡේදයේ 3 වන වගන්තිය. | - | ජනකලා කේන්ද්‍රයේ නේවාසිකාගාර පාලිකා (දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා 2011 වර්ෂයේ සිට බඳවාගැනීම් සිදු නොකර විශ්‍රාම ගිය උපදේශිකාවක අනියම් පදනම මත සේවයේ යොදවා තිබුණි. |
| (ii) XIX පරිච්ඡේදයේ 6.1 වගන්තිය | - | ජනකලා කේන්ද්‍රයේ උපදේශිකාවක විශ්‍රාම ලබා වර්ෂ 08 ක් ඉක්ම ගියද නිල නිවාසය ආපසු භාර දී නොතිබුණි. |
| (iii) XIX පරිච්ඡේදයේ 6.2 වගන්තිය | - | ජනකලා කේන්ද්‍රයේ උපදේශිකාවකට නිල නිවාසයක පදිංචිව සිටිය හැකි උපරිම කාලය වර්ෂ 05 ඉක්මවා වසර 26 ක් පදිංචිවීමට ඉඩ ලබාදී තිබුණි. |
| (ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| මුදල් රෙගුලාසි 156 | 485,559 | ජනකලා කේන්ද්‍රයේ විශ්‍රාම ගිය උපදේශිකාවකට ලබා දී තිබූ අවිධිමත් පත්වීම මත 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ගෙවන ලද වැටුප අදාල |

නිලධාරින්ගෙන් අයකරගත යුතුව තිබුණි.

**3.4 කාර්යසාධනය**

**----------------**

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

-----------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) උරුම සංරක්ෂණ හා ප්‍රවර්ධන ව්‍යාපෘතිය.**

**-------------------------------------------**

මෙම ව්‍යාපෘතිය සඳහා 2014 වර්ෂය වෙනුවෙන් රු.මිලියන 60 ක ප්‍රතිපාදන සළසා තිබුණි. ප්‍රකට හා අප්‍රකට පුරාවිද්‍යා ස්ථාන 100 ක් පිළිබඳ වාර්තාමය වැඩසටහන් නිර්මාණය, පහත රට සම්ප්‍රදායන් ආශ්‍රිත ශාන්තිකර්ම පිළිබඳ වැඩසටහන් සජීවිව පැවැත්වීම හා ඒවා රූපවාහිනී නාලිකාවල ප්‍රචාරය කිරීම, ශීර්ෂාභරණ පැළඳීම හා කළඑලි මංගල්‍ය පැවැත්වීම වැනි කටයුතු සඳහා මුළු පිරිවැය රු.30,110,442 ක් වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රතිපාදන සළසා තිබූ රු.මිලියන 60 කින් ඉතිරි රු.මිලයන 30 කට ආසන්න ප්‍රමාණය සඳහා 2014 වර්ෂයේදී ඉටුකිරීමට වැඩසටහන් / ව්‍යාපෘති කිසිවක් සැලැසුම්කර නොතිබුණි.

(ii) ප්‍රකට හා අප්‍රකට පුරාවිද්‍යා ස්ථාන 100 ක් පිළිබඳ වාර්තාමය වැඩසටහන් ඇතුළත් සංයුක්ත තැටි නිර්මාණය සඳහා සහ පූර්ව ප්‍රචාරක දැන්වීම් සැකසීමට රු.13,690,521 ක් වැයකර තිබුණ නමුත් මෙම වැඩසටහන් රූපවාහිනී මාධ්‍යයක් ඔස්සේ ප්‍රචාරය කිරීමට 2015 ජූනි මාසය වන විටත් කටයුතු කර නොතිබුණි.

(iii) ජාතික රූපවාහිනී නාලිකාව ඔස්සේ "උරුම සංරක්ෂණය" පිළිබඳව සෑම සිකුරාදාම ප.ව 4.00 සිට 4.55 දක්වා මිනිත්තු 44 බැගින් එක් වැඩසටහනක පිරිවැය රු.300,000 බැගින් වූ වැඩසටහන් 15 ක් විකාශනය කිරීමට සැලැසුම්කර තිබුණද, 2014 වර්ෂයේදී වැඩසටහන් 13 ක් පමණක් විකාශනය කර තිබුණි.

**(ආ) අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරය ප්‍රතිසංස්කරණය.**

**-------------------------------------------------------**

මෙම කෞතුකාගාර ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය හා මැදිරි නවීකරණය 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ ඉටුකිරීමට සැලැසුම්කර තිබුණි.

ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණ කටයුතු අවසන්කර තිබුණද 2015 ජුනි මාසය වන විටත් මැදිරි නවීකරණ කටයුතු අවසන් නොවීම නිසා කෞතුකාගාරය මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත කිරීමට නොහැකි වී තිබුණි.

**3.5 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) බණ්ඩාරවෙල බ්‍රෝටන් බංගලාව සංරක්ෂණය කිරීම.**

2014 – 2016 කාලපරිච්ඡේදය තුළ ජාතික උරුම පුහුණු මධ්‍යස්ථානයක් ලෙස බ්‍රෝටන් බංගලාව සංරක්ෂණය කිරීමට සැලැසුම් කර තිබුණි. මෙම බංගලාවේ වහලය ප්‍රතිසංස්කරණ කටයුතු බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව වෙත පවරා තිබූ අතර පළමු අදියර සඳහා රු.2,011,000 ක්ද දෙවන අදියර සඳහා රු.1,999,895 ක් වශයෙන් අමාත්‍යාංශය වෙත ඇස්තමේන්තු 02 ක් ඉදිරිපත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව වෙත අවස්ථා 03 කදී එකතුව රු.3,994,715 ක් 2014 වර්ෂයේදී ලබාදී තිබුණි. මෙම මුදලට අදාල වියදම් විස්තර, ප්‍රමාණ පත්‍ර හා කළ වැඩ වාර්තා කිසිවක් 2015 ජුනි මාසය වන විටත් අමාත්‍යාංශය වෙත ලබාදී නොතිබුණි.

(ii) බංගලාවේ වහලය සංරක්ෂණය සඳහා එකතුව රු.4,010,895 ක් වූ වැඩ කොටස් නිම කිරීමට අදියර I හා II වශයෙන් ඇස්තමේන්තු 02 ක් ඉදිරිපත් කිරීමේ සාධාරණත්වය විගණනයට අනාවරණය නොවුණි.

(iii) මෙම කොන්ත්‍රාත්තුවට අදාලව ගිවිසුමකට එළඹීම හෝ වැඩ නිමකළ යුතු කාල වකවානු පිළිබඳ එකඟතාවයක් ප්‍රාදේශීය සභාව සමඟ ඇතිකරගෙන නොතිබුණි.

**(ආ) රිටිගල පුරාවිද්‍යා ස්ථානය සංරක්ෂණය.**

රිටිගල පුරාවිද්‍යා ස්ථානයේ ප්‍රවේශ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මුළු ඇස්තමේන්තු මුදල වූ රු. 6,825,888 න් රු.මිලියන 04 ක් කැකිරාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත 2014 ජුනි 18 දින ලබාදී තිබුණි. මෙම ප්‍රවේශ මාර්ගය ප්‍රතිසංස්කරණය 2014 වර්ෂය තුළ අවසන්කර වියදම් වාර්තා ඉදිරිපත් කරන ලෙස දැනුම් දී තිබුණි.

සහකාර අධ්‍යක්ෂ(සැලසුම්) ගේ අංක NH/4/1/2/7/60 හා 2015 මැයි 21 දිනැති කැකිරාව ප්‍රාදේශීය ලේකම් අමතන ලද ලිපියට අනුව අදාල මාර්ගය මෝටර් ග්‍රේඩර් කිරීම හා කානු කැපීමේ කටයුතු පමණක් ඉටුකර ඇති බව ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු වලදී තහවුරු වූ බව සඳහන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් ගෙවා වසරකට ආසන්න කාලයක් ගතවී තිබුණද ඉටුකර තිබුණේ ඇස්තමේන්තුවේ 1,2 හා 3 වැඩ කොටස් පමණි.

(ii) ඇස්තමේන්තුවේ 4,5,6 හා 7 වැඩකොටස් වන බොරළු ඝන මීටර් 3024 ක් සපයා, මාර්ගයේ අතුරා තැලීම හා බෝක්කු 5ක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල වූ රු. 5,390,495 ක වැඩකොටස් 2015 මැයි 21 දින වනවිටත් ඉටුකර නොතිබුණි.

(iii) කැකිරාව ප්‍රාදේශීය ලේකම් විසින් අමාත්‍යාංශ ලේකම් අමතන ලද අංක අනු/21/3/1 වෙනත් හා 2015 ජුනි 16 දිනැති ලිපියට අනුව එදින දක්වා දරා ඇති වියදම රු. 761,017 ක් පමණක් බව තහවුරු කර තිබුණි.

(iv) ඇස්තමේන්තුවේ වැඩ කොටස් 01 සිට 07 දක්වා එකතුව රු. 6,094,543 ක වටිනාකමින් ඉටුකර ඇති වැඩ ප්‍රමාණය සියයට 12 කි. එමෙන්ම ලබාදී ඇති මුදලෙන් වැයකර ඇති ප්‍රතිශතය සියයට 19 කි. ඒ අනුව ව්‍යාපෘතිය ඉටුකිරීමේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය ඉතා අඩු මට්ටමක පැවතුණි.

(v) මෙම කොන්ත්‍රාත්තුව කැකිරාව ප්‍රාදේශීය සභාවට පැවරීමේදී ගිවිසුමකට එළඹීම හෝ වැඩ අවසන් කලයුතු දින වකවානු පිළිබඳ එකඟතාවයකට පැමිණීම හෝ සිදුකර නොතිබුණි.

**(ඇ) රිටිගල පුරාවිද්‍යා ස්ථානයට විදුලිය සැපයීම.**

---

කිලෝමීටර් 2.8 ක් පමණ දුර පිහිටි රිටිගල පුරාවිද්‍යා ස්ථානයට විදුලිය සැපයීම සඳහා 2014 ජනවාරි මාසයේදී ලංකා විදුලිබල මණ්ඩලයට රු.6,979,000 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ලංකා විදුලිබල මණ්ඩලය විසින් ඒවා තිබූ 2014 දෙසැම්බර් 30 දිනැති ලිපියට අනුව විදුලිය සැපයීමේ පිරිවැය රු.6,333,912 ක් වන බවත් රු.645,087 ක මුදලක් ඉතිරිව පවතින බවත් දැනුම් දී තිබුණි. මෙම ඉතිරි මුදල ආපසු ලබා ගැනීමට 2015 ජුනි 30 දින වන විටත් කටයුතුකර නොතිබුණි.

(ii) විදුලිබල මණ්ඩලය විසින් අදාල විදුලි සැපයුම 2015 ජුනි මාසය වනවිට සම්පූර්ණ කර තිබුණද ගොඩනැගිල්ලෙහි අභ්‍යන්තර විදුලි පද්ධතියට අදාල

කටයුතු සිදු නොකිරීම නිසා පුරාවිද්‍යා ස්ථානයට විදුලි ආලෝකය ලබාගැනීම අවසන්ව නොතිබුණි.

**3.6 පාඩු හා හානි.**

දෙපාර්තමේන්තු නිලධාරියෙක් භාරයේ තිබූ රු.115,000 ක් වටිනා ලැප්ටොප් පරිගණකය 2012 දෙසැම්බර් මාසයේ නැති වී තිබුණි. මේ පිළිබඳ මූලික විමර්ශනයක් සිදුකර තිබූ අතර මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව පරිපූර්ණ වාර්තාවක් 2015 මැයි මාසය වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. මේ පිළිබඳව පොලිසිය විසින් පරීක්ෂණ පවත්වමින් තිබූ අතර එහි ප්‍රතිඵල අසතුටුදායක වුවහොත් මූලික විමර්ශන වාර්තාවෙන් පෙන්වා දී ඇති පරිදි රු.115,000 ක වටිනාකම අයකර ගැනීමට කටයුතු කරන බව වාර්තා කර තිබුණි.

**3.7 මානව සම්පත් කළමනාකරණය.**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 13 | 13 | - |
| (ii) | තෘතීයික මට්ටම | 03 | 02 | 01 |
| (iii) | ද්විතීයික මට්ටම | 47 | 34 | 13 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 24 | 23 | 01 |
| | වෙනත් | 04 | 02 | 02 |
| | **එකතුව** | **91** | **74** | **17** |

සමාලෝචිත වර්ෂය අවසානය වන විට පුරප්පාඩු 17 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

## 4. ශීර්ෂ 207 - පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

### 4.1 ගිණුම් ඉදිරිපත් කිරීම.

විෂය අංක 20701 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය 2014 නොවැම්බර් 04 දිනැති අංක 238/2014 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව 2015 අප්‍රේල් 30 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එය 2015 මැයි 26 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 4.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.

දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි 802 ප්‍රකාරව වාහන ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.

### 4.3 අයවැය විචලනය

වැය විෂයයන් 08 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 ක සිට සියයට 81 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### 4.4 පොදු තැන්පත් ගිණුම

2014 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 02 ක් ඉක්මවූ එකතුව රු.8,456,333 ක්වූ තැන්පතු 25 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 4.5 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 20701 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, එදිනට අයවීම් හිඟහිට තිබුණු රු.2,205,729 ක් වූ ණය ශේෂ එකතුවකින් වර්ෂ 05 ට වැඩි කාලයක සිට පැවැත එමින් තිබුණු එකතුව රු.1,077,662 ක හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

### 4.6 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

#### 4.6.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**4.6.2 විගණන හා කළමනාකරණ කමිටුව.**

සමාලෝචිත වර්ෂයේදි විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් වාරයක් පමණක් පවත්වා තිබුණි.

**4.7 වත්කම් කළමනාකරණය**

දෙපාර්තමේන්තුවේ වත්කම් පිළිබඳව සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

**(i) රංචාමඩම කෞතුකාගාරය විවෘත නොකිරීම.**

රංචාමඩම ප්‍රාග් ඓතිහාසික කෞතුකාගාරය ඉදිකිරීම සඳහා 2011 වර්ෂයේදී රු.මිලියන 5.5 ක් වැයකර තිබුණි. ඉඩමේ අයිතිය දෙපර්තමේන්තුව වෙත පවරා ගෙන නොතිබීම, විදුලි සැපයුම ලබා නොගැනීම, ගොඩනැගිලි නඩත්තුව, පිවිසුම් මාර්ගය හා පොදු පහසුකම් සපයා නොතිබීම වැනි ගැටළු නිරවුල් කර නොගැනීම නිසා 2015 ජුනි 15 දින වන විටත් කෞතුකාගාරය විවෘත කර නොතිබුණි.

**(ii) දීඝවාපී කෞතුකාගාරය අළුත්වැඩියා කටයුතු අතරමග නවතා දැමීම.**

කෞතුකාගාර ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා 2011 හා 2012 වර්ෂවල පිළිවෙලින් රු.385,033 ක් හා රු.1,186,320 ක් වටිනාකමකින් යුතු ඇස්තමේන්තු අනුමත කර තිබුණි. 2012 වර්ෂය අවසානයේදී ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කර වහලයේ අළුත්වැඩියා කටයුතු අඩක් නිමකර ප්‍රතිසංස්කරණ කටයුතු අතරමග නවතා තිබුණි. නිම කළ කොටසේ මුදුන් උළු සෙවිලි කර නොතිබුණු බැවින් ගොඩනැගිල්ල සහ වහලයේ ලී 2015 මැයි මාසය වන විටත් වර්ෂාවට තෙමෙමින් පැවතුණි. කෞතුක භාණ්ඩ 263 ක් ද ගොඩනැගිල්ලේ කාමරයක තැන්පත් කර අනාරක්ෂිතව පැවැති අතර අළුත්වැඩියා කටයුතු නිම නොකිරීම හේතුවෙන් කෞතුකාගාරය 2011 අගෝස්තු මාසයේ සිට වසාදමා තිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම.**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2015 මාර්තු 31 දින වන විට විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබූ නමුත් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල/ කෞතුකාගාර සතු කෞතුක භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර නොතිබුණි.

**4.8 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | | | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| | **(i)** | මුදල් රෙගුලාසි 395(ඇ) | යාපනය පුරාවිද්‍යා ප්‍රාදේශීය කාර්යාලයේ ජංගම ගිණුමට අදාලව බැංකු සැසඳුම් ප්‍රකාශ 2014 අප්‍රේල් මාසයේ සිට පිළියෙල කර නොතිබුණි. |
| | **(ii)** | මුදල් රෙගුලාසි 756 හා 757 | වර්ෂය අවසානයේ පැවැත්විය යුතු වාහන පිළිබඳ සමීක්ෂණය පවත්වා නොතිබුණි. |

**4.9 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා**

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකිරීම.**

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කර නොතිබුණි.

| ව්‍යාපෘතිය | | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ යුතු දිනය | ආරම්භ නොකිරීමට හේතු |
|---|---|---|---|---|
| | | රු. | | |
| (i) | අම්බලන්තොට වැලිපටන්විල ගංගාරාමය | 4,429,276 | 2014.03. 12 | 2015 පෙබරවාරි මාසය දක්වා ප්‍රමාද වී ව්‍යාපෘතිය අනුමත කිරීම |
| (ii) | කෝට්ටේ රාජධානිය අවට ප්‍රදේශය ගවේෂණය අදියර 2 | 196,665 | 2014.10.01 | වර්ෂාව නිසා භෞතික කාර්යයන් සිදු නොකිරීම. |
| (iii) | වේරගොඩ ස්තූප ගොඩනැගිල්ල පාදා සංරක්ෂණය | 255,900 | 2014.01.21 | මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් මුදල් නොලැබීම. |
| (iv) | උතුරු පළාත් පුරාවිද්‍යා ස්ථාන, ස්මාරක ලේඛනගත කිරීමේ ගවේෂණය | 131,679 | 2014.03.03 | මුදල් ඉතිරි වුවහොත් ඊළඟ අදියර සඳහා භාවිතා කිරීම. |

**(ආ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

පහත සඳහන් ව්‍යාපෘති සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක දිනයන් සඳහන් කර තිබුණද භෞතික ප්‍රගති වාර්තාවට අනුව පහත පරිදි ප්‍රමාදවීම් සිදු වී තිබුණි.

| ව්‍යපෘතිය | | ඇස්තමේන්තු ගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිමකළ යුතු දිනය | **2014.12.31** දිනට මූල්‍ය ප්‍රගතිය | **2014.12. 31** දිනට භෞතික ප්‍රගතිය | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|---|---|
| | | රු. | | | සියයට | සියයට | |
| (i) | කිරින්ද පුහුවැල්ල පූර්වාරාමය ආවාසගෙය සංරක්ෂණය | 1,788,783 | 2014.05 10 | 2014.10.07 | 13 | 31 | ඇස්තමේන්තුගත සම්පූර්ණ මුදල එකවර නොලැබීම. |
| (ii) | මැදිලිය අම්බලම හා ධර්ම ශාලාව නඩත්තුව | 2,620,380 | 2014.07. 24 | 2014.12. 31 | 14 | 50 | 2015 දී අවසන් කර ඇත. |
| (iii) | මහනුවර උල්පැන්ගේ සංරක්ෂණය | 38,085,685 | 2014 ජන | 2014 දෙසැ. | 05 | 35 | අවශ්‍ය ද්‍රව්‍ය කඩිනමින් සපයා ගැනීමට නොහැකි වීම. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (iv) | නාලන්ද ගෙඩිගේ විහාරයේ පෙත්මග සැකසීම. | 509,000 | 2014.05. 01 | 2014.09.15 | 42 | 31 | සැපයුම්කරුවන් විසින් නිසි වේලාවට ද්‍රව්‍ය නොසැපයීම |
| (v) | සාගම දැගැබ සංරක්ෂණය | 1,599,500 | 2014.02. 20 | 2014.09. 10 | 02 | 40 | හේතු දක්වා නැත. |
| (vi) | සිතුල්පව්ව ලෙන් විහාරය අසල පඩිපෙල | 271,205 | 2014.09.10 | 2014.11.30 | - | 35 | හේතු දක්වා නැත. |

## 4.10 කාර්යසාධනය

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ කාර්යයන්.

අමාත්‍යාංශය විසින් ඉටු කළ යුතු කාර්යයන් ඉටු නොකර තිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය විය. එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

#### (i) දීඝවාපිය දාගැබ සංරක්ෂණ කටයුතු ආරම්භ නොකිරීම.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- දීඝවාපිය චෛත්‍ය සංරක්ෂණය සඳහා නිශ්චිත කාල රාමුවක් සහිතව නිම කළ යුතු වැඩ කොටස් අදියරෙන් අදියර වර්ගකර, අවශ්‍යනම් විද්වතුන්ගේ සහයද ලබාගෙන පූර්ව සැලැස්මක් පිළියෙල කර මාසයක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස 2014 සැප්තැම්බර් 05 දිනැති ලිපියෙන් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දී තිබුණු නමුත් 2015 ජුනි 15 දින වන විටත් අදාල පූර්ණ සැලැස්ම සකස් කර නොතිබුණි.
- දීඝවාපිය ස්තූපය වටා පිහිටි අඩි 18 ක් පමණ උස චෛත්‍ය බැම්ම ශක්තිමත් නොවීම නිසා එහි සියයට 95 ක් පමණ ගලවා ඉවත්කර තිබුණු නමුත් සංරක්ෂණ කටයුතු ඒ සමඟ ආරම්භ නොකිරීම නිසා දාගැබ සම්පූර්ණයෙන් නිරාවරණය වී තිබුණි. එම නිසා කාළගුණික තත්ත්වයේ සිදුවිය හැකි වෙනස්වීම් හේතුවෙන් අවදානමට ලක්වීමේ ඉඩකඩ තිබුණි. මේ සම්බන්ධයෙන් 2014 දෙසැම්බර් 24 දිනැති සහකාර අධ්‍යක්ෂ (නැගෙනහිර) ගේ ලිපිය මගින් අධ්‍යක්ෂ ජනරාල්ගේ අවධානය යොමුකර

තිබුණත්, 2015 මැයි මාසය අවසාන වන විටත් අදාළ සංරක්ෂණ කටයුතු ආරම්භ කර නොතිබුණි.

- සංරක්ෂණ කටයුතු සඳහා 2014 වර්ෂයේදී ගඩොල් 377,000 ක් රු.6,032,000 කට වැඩබිමට සපයා තිබූ අතර එහි ලොට් අංක 04,05 හා අංක නොකර තිබුණු ගඩොල් ගොඩවල්වල තැනින් තැන ගඩොල් යම් ප්‍රමාණයක් දියවෙමින් පැවතුණි. ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් සිදුකළ P.S.I අගය පිළිබඳ නියැදි පරීක්ෂණ වාර්තා අනුව ලොට් අංක 01 හි ගඩොල් 7825 ක් හැර සෙසු ගඩොල් SLS 39:1978 පිරිවිතරයේ Type II, Grade 2 ප්‍රමිතියට අනුකූල බව තහවුරු කර තිබුණි. ගඩොල් වැඩබිමට සපයන අවස්ථාවේ භෞතිකව පරීක්ෂා නොකර තොග පොත්වලට ඇතුළත්කර තිබූ අතර නුසුදුසු ගඩොල් කොපමණ ප්‍රමාණයක් වැඩබිම තුළ පවතීද යන්න ගඩොල් සපයා මාස 06 ක් ඉක්ම ගියද ගණන් බලා නොතිබුණි.

**(ii) නීලගිරිය ස්ථූපය සංරක්ෂණය කිරීම.**

----------------------------------------

අම්පාර දිස්ත්‍රික්කයේ ලාහුගල රක්ෂිතය තුළ පිහිටි නීලගිරිය ස්ථූපයේ කැණීම් අවසන් කර වට අඩි 600 ඉක්මවූ සහ උස මීටර් 21.4 ක් වූ ස්ථූපය පාදාගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී සංරක්ෂණ කටයුතු ආරම්භ කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- දාගැබ සංරක්ෂණය සඳහා නිශ්චිත කාල රාමුවක් සහිතව නිමකළ යුතු වැඩ කොටස් අදියරෙන් අදියර වර්ගකර සකස් කරන ලද පූර්ණ සැලැස්මක් නොතිබුණි.

- කැණීම් සිදුකර දාගැබ පාදාගැනීමෙන් පසු දාගැබ වටා ස්ථිර ශක්තිමත් බැම්මක් නොපවතින අතර විධිමත් සංරක්ෂණ සැලැස්මක් ක්‍රියාත්මක නොවීම මත කාලගුණික තත්ත්වයේ සිදුවිය හැකි වෙනස්වීම් මත දාගැබ අනතුරට ලක්වීමේ හැකියාව තිබුණි.

- ස්ථූපයේ පේසා වළලු සංරක්ෂණ කටයුතු අඩක් පමණ නිමකර තිබියදී 2014 ඔක්තෝබර් 29 දින නතර කර තිබූ අතර 2015 මැයි මාසය වන විටත් නැවත සංරක්ෂණ කටයුතු ආරම්භ කිරීම සඳහා ඇස්තමේන්තු අනුමතකර නොතිබුණි.

- දාගැබ වටා පිහිටි මළුවේ කැණීම් සිදුකළ ස්ථානවල පුරාවස්තු යටවන අයුරින් වැසි දිනවලදී ජලය එක්රැස්වන බැවින් ජලය බැසයාමට ක්‍රමයක් සකස් කළ යුතුව තිබුණි.

**(iii) යුධගනාව දාගැබ සංරක්ෂණය.**

---------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටුව විසින් 2014 මැයි 07 දින හා 2014 නොවැම්බර් 13 දිනවල ගත් තීරණවලට අනුව එකක් රු.16 බැගින් ගඩොල් 418,803 ක් යුධගනාව දාගැබ සංරක්ෂණය සඳහා ඇණවුම් කර තිබුණි. නමුත් 2015 ජුනි මාසය වන විටත් ඇණවුම් කළ ගඩොල් 112,253 ක් සැපයීමට සැපයුම්කරු අපොහොසත් වී තිබුණි.
- සංරක්ෂණ කටයුතු සඳහා 2011 වර්ෂයේදී මිලදී ගත් සිමෙන්ති කොට්ට 82 ක් කල් ඉකුත්ව තිබූ අතර 2014 දෙසැම්බර් 01 දින මිලදී ගත් සිමෙන්ති කොට්ට 47 ක් 2015 මැයි 21 දින වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

**(iv) රත්නපුර ඇහැලේපොල අන්තඃපුර මාළිගය අළුත්වැඩියා කටයුතු ප්‍රමාද වීම.**

--------------------------------------------------------------------------------

රත්නපුර නගරයේ ෆර්ගියුශන් බාලිකා විද්‍යාලයට ආසන්න උස් භූමි භාගයක පිහිටි දෙමහල් ගොඩනැගිල්ලක් වන ඇහැලේපොල අන්තඃපුර මාළිගය 2010 වර්ෂයේදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට පවරාගෙන තිබුණි. 2011, 2012 හා 2014 වර්ෂවලදී මෙම ගොඩනැගිල්ලේ අළුත්වැඩියා කටයුතු සඳහා පිළිවෙලින් රු.2,847,610, රු.1,563,757 හා රු.4,256,878 ක් වශයෙන් ඇස්තමේන්තු අනුමතකර තිබුණි. 2014 වර්ෂයේදී මෙහි අළුත්වැඩියා කටයුතු සබරගමුව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය මඟින් ඉටු කර ගැනීමට යෝජනා වී තිබුණි. එම කාර්යාලය විසින් 2014 දෙසැම්බර් 31 දින රු.6,575,000 ක වියදම් ඇස්තමේන්තුවක් සකස් කර අවබෝධතා ගිවිසුම අත්සන් කරන ලෙස දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා තිබුණි.

ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය විසින් 2014 ජූලි 28 දින රු.1,064,220 ක් හා 2014 දෙසැම්බර් 31 දින රු.5,507,780 ක් වශයෙන් එකතුව රු. 6,572,000 ක මුදල ලබා දී තිබුණු නමුත් 2015 මැයි 31 දින වන විටත් පුරාවිද්‍යා ස්මාරකයේ සංරක්ෂණ කටයුතු ආරම්භ කර නොතිබූ අතර ඉංජිනේරු සේවා කාර්යාලය සමග ගිවිසුමකට එළඹීම හෝ සිදුකර නොතිබුණි.

**(v) පුස්තකාල පොත් හා ඡායාරූප සංරක්ෂණය.**

--------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ප්‍රධාන කාර්යාල භූමියේ පිහිටි පුස්තකාලයේ ඇති වටිනා පොත් අතරින් ඉතා දැඩිලෙස හානියට පත් වූ පොත්, තරමක් දුරට හානියට පත් තිබුණු පොත් හා

ස්වල්ප වශයෙන් හානියට පත් වී තිබුණු පොත් වශයෙන් පිළිවෙලින් 2000,3000 හා 1000 හඳුනාගෙන තිබුණි. මෙම පොත් සංරක්ෂණය කිරීමේ අවශ්‍යතාවය 2001 වර්ෂයේ සිට පෙන්වා දී තිබූ අතර එය ඉටු වී නොතිබුණි.

- අනුරාධපුරය, පොළොන්නරුව, සීගිරිය හා මිහින්තලය යන ස්ථානයන්හි පෞරාණික ස්ථානයන් කේන්ද්‍රකොට ගනිමින් වර්ෂ 1868 සහ 1880 තුළදී ගත් දුලබ ඡායාරූප 227 කින් සමන්විත "ලෝටන් ඡායාරූප ඇල්බමය" හා සෙසු දුර්ලබ පොත්වල ඇතුළත් තොරතුරු මතු පරපුර වෙනුවෙන් ආරක්ෂා කරගැනීමේ අරමුණින් සූක්ෂම ඡායාගත කිරීම (Micro Film) හෝ ඡායාගත කිරීම (Scan) සඳහා පියවර ගෙන නොතිබුණි.

**(vi) ප්‍රාග් ඓතිහාසික මානව විද්‍යා කෞතුකාගාරයේ කටයුතු ආරම්භ නොකිරීම.**

පුරාවිද්‍යා ක්ෂේත්‍ර තුළ ප්‍රාග් ඓතිහාසික මානව විද්‍යා කෞතුකාගාරයක් ස්ථාපනය කිරීම තුළින් ඓතිහාසික මානවයාගේ විවිධ චර්යා රටාවන්, තාක්ෂණය, නිර්මාණාත්මක හැකියාව හා එකල පැවති ශාක, සත්ව, භූගෝලීය පාරිසරික තත්ත්වයන් පිළිබඳව සමීප අත්දැකීම් ලැබීමේ හැකියාව මෙන්ම පර්යේෂණ සිදුකිරීමේ හැකියාව ලැබෙන බව කෞතුකාගාර අංශයේ වාර්තා අනාවරණය කර තිබුණි. 2007 වර්ෂයේදී බුලත්සිංහල පාහියංගල ලෙන ආසන්නයේ මෙම කෞතුකාගාරය ඉදිකිරීමට දෙමහල් ගොඩනැගිල්ලක සැලැස්මක් සකස්කර ප්‍රදර්ශන මැදිරි නිර්මාණය කිරීම සඳහා රු.363,038 ක ඇස්තමේන්තු සකස්කර තිබුණි. 2014 වර්ෂයේදී ඉඩමේ මායිම් ලකුණු කිරීමද සිදුකර තිබුණු යෝජිත ඉඩමේ අයිතිය පිළිබඳ ගැටළු හා මූල්‍ය ප්‍රතිපාදන පිළිබඳ ගැටළු හේතුවෙන් ඉදිකිරීම් සැලැසුම්කර වසර 07 ක් ඉක්මවා තිබුණත් එහි ඉදිකිරීම් ආරම්භකර නොතිබුණි.

## 4.11 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

**ගැලපුම් කළයුතු ශේෂ**

දෙපාර්තමේන්තුව විසින් 2014 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව 2008 ජනවාරි මාසයේදී හඳුනා නොගත් හර ශේෂ 03 එකතුව රු.1,009,990 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි.

**4.12 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

----------------------------------

**ඉන්ධන නිකුත් කිරීම**

**----------------------**

දෙපාර්තමේන්තුවේ නිල වාහන හිමි නිලධාරින් සිවු දෙනෙකු විසින් ලබා ගනු ලබන ප්‍රවාහන දීමනාවට අමතරව 2006 ජුලි 14 දිනැති අංක 11/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව සමාලෝචිත වර්ෂයේ මාර්තු මාසයේ සිට ඔක්තෝබර් මාසය දක්වා කාලය තුළ ඉන්ධන ලීටර් 6071 ක් ඉන්ධන ඇණවුම් මගින් ලබාගෙන තිබුණි.

**4.13 පාඩු හා හානි**

**-------------**

දීසවාපිය දාගැබේ සංරක්ෂණ කටයුතු සඳහා 2014 වර්ෂයේ මිලදී ගෙන තිබූ වැලි තොගවලින් රු.113,430 ක් වටිනා වැලි කියුබ් 19.90 ක ඌනතාවයක් නිරීක්ෂණය විය.

**4.14 කළමනාකරණ දුර්වලතා**

----------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

**(අ) පුරාවස්තු තැගි අරමුදල**

**------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** 1998 අංක 24 දරන පුරාවස්තු (සංශෝධන) පනතින් සංශෝධනය කරන ලද 1940 අංක 09 දරන පුරාවස්තු ආඥා පනතේ 46(1) වගන්තිය යටතේ පුරාවස්තු තැගි අරමුදල ස්ථාපිත කර තිබුණි. දිවයිනේ විවිධ ප්‍රදේශවල පිහිටි උසාවි විසින් නියම කරන ලද දඩ මුදල් මෙම අරමුදලට එකතු වී තිබුණි. 2010 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා එකතුවී තිබුණු රු.64,105,390 ක් 2014 මැයි 31 දින වන විටත් අරමුදල පිහිටුවීමේ අරමුණු සඳහා යොදා නොගෙන පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

**(ii)** ගලෙන් බිඳුනු වැව පොලීසිය විසින් කහටගස්දිගිලිය මහේස්ත්‍රාත් අධිකරණයේ පවරන ලද නඩු තුනකට අදාලව 2010 වර්ෂයේ උසාවිය නියම කළ දඩ මුදල්වලින් පුරාවිද්‍යා තැගි අරමුදලට ලැබිය යුතු රු.මිලියන 6.45 කින් රු.මිලියන 1.45 ක් පමණක් අරමුදල වෙත ලැබී තිබුණි.

**(ආ) මධ්‍යම පළාතේ ප්‍රසම්පාදන කටයුතුවල අක්‍රමිකතා**

**--------------------------------------------------**

2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාලයට අදාල මධ්‍යම පළාතේ පුරාවිද්‍යා ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් අක්‍රමිකතා අනාවරණය වී

තිබුණි. අක්‍රමිකතා පිළිබඳව මූලික විමර්ශන පවත්වා තිබුණත් එම විමර්ශනයේ නියෝගවලට එරෙහිව අධිකරණයේ නඩු පැවරීම මත නැවත මූලික විමර්ශනයක් පැවැත්වීමට අමාත්‍යාංශය එකඟ වී තිබුණි. ඒ අනුව 2014 වර්ෂයේ පවත්වන ලද මූලික විමර්ශනයට අදාල වාර්තාව අනුව දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පස් දෙනෙකුට විරුද්ධව චෝදනාපත්‍ර කෙටුම්පත් කර 2015 මාර්තු 11 දින පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට භාර දී තිබුණි. එසේ භාරදීමෙන් පසුව මාස 03 ක් ඉක්ම ගියද ලිපි ලේඛනවල මුල් පිටපතක් හෝ සහතික කළ පිටපත් කොටසක් නොමැති බව සඳහන් කර 2015 ජුනි 15 දින වන විටත් අදාල නිලධාරීන්ට චෝදනා පත්‍ර භාරදී නොතිබුණි.

**(ඇ) අලකේෂ්වර කලාප කාර්යාලය හා ගබඩාව ඉදිකිරීම.**

කෝට්ටේ අලකේෂ්වර වැඩබිමෙහි කලාප කාර්යාලයක් හා ගබඩා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2013 වර්ෂයේදී රු.1,281,188 කට ඇස්තමේන්තු සකස් කර තිබුණි. නමුත් ඉඩමේ පිඹුරුපත දෙපාර්තමේන්තුව සතුව නොතිබීම නිසා ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඉඩමේ පිඹුරුපත ලබාගෙන තිබූ නමුත් ගොඩනැගිලි සැලැසුම සඳහා නගර සභාවේ අනුමැතිය 2015 ජුනි 15 දින වන විටත් ලබාගෙන නොතිබීම නිසා ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි.

## 4.15 මානව සම්පත් කළමනාකරණය

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 52 | 11 | 41 |
| (ii) තෘතියික මට්ටම | 56 | 26 | 30 |
| (iii) ද්විතියික මට්ටම | 737 | 487 | 250 |
| (iv) ප්‍රාථමික මට්ටම | 1,610 | 1,330 | 280 |
| **එකතුව** | **2,455** | **1,854** | **601** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුවේ අංශ ප්‍රධානී තනතුරුවලට අදාල අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ හා සහකාර අධ්‍යක්ෂ යන තනතුරු ඇතුළු ජ්‍යෙෂ්ඨ මට්ටමේ

තනතුරු 52 න් 41 ක් 2014 දෙසැම්බර් 31 දින වන විටත් පුරප්පාඩුව පැවතුණි.

(ii) දෙපාර්තමේන්තුව සඳහා කාර්මික නිලධාරී තනතුරු 44 ක් අනුමත කර තිබුණත් 2014 දෙසැම්බර් 31 දින වන විට එම තනතුරු වලින් 21 ක් පුරප්පාඩුව පැවතුණි.

(iii) සේවය අත්හිටවන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරිණියකගේ සේවා කාලය තුළ ලබාගත් වැටුප් රහිත නිවාඩු/ අඩ වැටුප් සහිත නිවාඩු වෙනුවෙන් රු.136,558 ක් අයවීමට තිබුණි.

**5. ශීර්ෂ 208 - ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව.**

**5.1 අයවැය විචලනය**

වැය විෂයයන් 02 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් එකතුව රු.34,200,000 ක ප්‍රතිපාදනවලින් රු.6,872,000 ක් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි. ඉතිරි ශුද්ධ ප්‍රතිපාදනවලින් උපයෝජනය කළ පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 18 ක සිට සියයට 23 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**5.2 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 20801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.548,809 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**5.3 වත්කම් කළමනාකරණය**

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

2011 වර්ෂයේ ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය සමග ඇතිකරගත් ගිවිසුමක් මත කොළඹ කෞතුකාගාර පරිශ්‍රයේ ඉදිකර 2013 වර්ෂයේදී භාරදී තිබූ මහල් 02 කින් සමන්විත නිවසේ වර්ග අඩි 1209 කින් යුත් ඉහල මහලේ තක්සේරු වටිනාකම රු.9,430,200 ක් විය. ගෘහ උපකරණ සපයා නොතිබූ මෙම කාමර 02 කින් සමන්විත කොටස 2015 ජුනි මාසය වන විටත් ඌන උපයෝජිතව පැවතුණි.

**5.4 කාර්යසාධනය**

**-------------------**

**ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ කාර්යයන්**

**--------------------------------------------**

මහනුවර කෞතුකාගාර පරිශ්‍රයේ වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කිරීම සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් රු.3,870,000 ක ඇස්තමේන්තුවක් 2013 වර්ෂයේදී සකස් කර තිබුණි. 2014 වර්ෂයේදී මෙම අළුත්වැඩියා කටයුතු ආරම්භ කර නොතිබුණි.

**5.5 ප්‍රමාද වූ ව්‍යාපෘති**

**-----------------**

දෙපාර්තමේන්තුව විසින් ඉටු කළ යුතු පහත සඳහන් කාර්යයන් ඉටු කිරීමට අපොහොසත් වී තිබුණි.

(අ) මහනුවර කෞතුකාගාරයේ, කෞතුකාගාර ගොඩනැගිල්ල හා නිල නිවාසය අළුත්වැඩියා කිරීම සඳහා පිළිවෙලින් රු.16,990,000 ක් හා රු.3,400,000 ක් 2014 වර්ෂයේදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ලබා දී තිබුණි. 2014 සැප්තැම්බර් 10 දින සිට දෙසැම්බර් 31 දින දක්වා අළුත්වැඩියා හේතුවෙන් කෞතුකාගාරය වසා තබන බවට නිවේදනය කර තිබුණද, 2015 ජූනි මාසය වන විටත් අදාල අළුත්වැඩියා කටයුතු අවසන් කර නොතිබූ බැවින් කෞතුකාගාරය විවෘත කිරීමට නොහැකි වී තිබුණි.

(ආ) කොළඹ කෞතුකාගාර පරිශ්‍රයේ අස්ථික මැදිරිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2013 මැයි 30 දින ආරම්භ කර තිබූ අතර ලිත් මාස 09 ක් තුළදී නිමකළ යුතුව තිබුණි. නමුත් අවස්ථා කීපයකදී කාලය දීර්ඝ කර තිබූ අතර අවසන් වරට 2014 අගෝස්තු 30 දින දක්වා කාලය දීර්ඝ කර තිබුණි. තල්මසාගේ අස්ථි පද්ධතිය සැකසීමේ කටයුතු හා සෙසු අස්ථි පද්ධතීන් ස්ථාපිත කිරීමේ කටයුතු අවසන් වන තෙක් බිම ටයිල් කිරීමේ කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී තිබූ අතර 2015 ජූනි මාසය වන විටත් අස්ථි පද්ධතීන් සැකසීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

**5.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**--------------------------------**

වර්ෂ 10 ක කාලයක් සඳහා ජාතික කෞතුකාගාර පරිශ්‍රයේ ඇති දෙමහල් ගොඩනැගිල්ලේ වර්ග අඩි 8000 කින් යුත් භූමි ප්‍රමාණය හා ඊට අදාළ පොදු පහසුකම්ද සමග කෞතුකාගාර සමරුහලක් හා ආපනශාලාවක් වර්ෂ 10 ක කාලයට අදාළව පවත්වාගෙන යාමට ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයට 2011 අගෝස්තු 10 දින ඇති කර ගත් ගිවිසුමක් මත බදු දී තිබුණි. ආදාල බදු ගිවිසුම හා ලක්සල පවත්වාගෙන යාමේ කටයුතු සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරික්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය විසින් කෞතුකාගාර පරිශ්‍රයේ පිහිටි බදු ගොඩනැගිල්ල නවීකරණය කිරීමේදී කෞතුකාගාරයට අයත් වඩු කාර්මික අංශය ස්ථාපිතව පැවති පැරණි

ගොඩනැගිල්ල නීතියට පටහැනිව අත්පත් කරගෙන තිබූ අතර 2015 ජුනි මාසය වන විටත් එම ආයතනය භාරයේ තිබුණි.

(ආ) 2011 වර්ෂයේ ලක්සල ආයතනය සමඟ ඇතිකරගත් ගිවිසුමට අනුව ගොඩනැගිලි ඉදිකිරීමේදී කෞතුකාගාර පරිශ්‍රයේ පැවති පුරාවිද්‍යා වටිනාකමක් සහිත පැරණි ස්මාරකයක් වන වික්ටෝරියා පිළිමය පරිශ්‍රයෙන් පිටතට ගෙන වැටක් සකස් කිරීම තුළින් එම ප්‍රතිමාව මහාමාර්ගයට නිරාවරණව පැවැතුණි. ප්‍රතිමාවේ ආරක්ෂාව සම්බන්ධයෙන් ගැටළු මතුවන කරුණක් බව අවස්ථා කීපයකදීම ලක්සල ආයතනය දැනුවත්කර තිබුණද, පෙර පැවති ආකාරයට පිළිමය ස්ථාපිත කිරීම 2015 ජුනි මාසය වන විටත් සිදුකර නොතිබුණි.

(ඇ) කරත්ත මැදිරිය තුළ ඉපැරණි කරත්ත 07 ක් ප්‍රදර්ශනය සඳහාද, ලක්සලට අයත් කරත්ත 04 ක් අලෙවිය සඳහාද, එකම මැදිරියේ තබා තිබුණි.මෙම මැදිරියේ අයිතිය කෞතුකාගාරය සතු වුවත්, එහි යතුර කෞතුකාගාරයට භාරදී නොතිබුණ අතර නඩත්තු කටයුතු ලක්සල ආයතනය විසින් සිදුකර තිබුණි. මෙම ගොඩනැගිල්ල වීදුරු යොදා මුද්‍රා තබන ලද ගොඩනැගිල්ලක් ලෙස සකස් කර තිබුණද වායු සමීකරණ යන්ත්‍ර ක්‍රියාත්මකව නොතිබුණි. හිරු එළිය හා වාතය ලැබීම මෙන්ම උෂ්ණත්වය අඩු තත්ත්වයක පැවතිය යුතු වුවත්, එම අවශ්‍යතාවන් ඉටුවී නොතිබුණි. ආයතන 02 ක අරමුණු උදෙසා එකම මැදිරියක් තුළ පැරණි භාණ්ඩ තබා ගැනීම නිසා ඒවායේ වගකීම හා ආරක්ෂාව පිළිබඳව ගැටළු මතුවී තිබුණි.

(ඈ) 2011 වර්ෂයේ ලක්සල ආයතනය සමග ඇතිකරගත් ගිවිසුමේ සමහර වගන්ති (ආරක්ෂාව සැපයීම හා නඩත්තු කටයුතු වැනි) සංශෝධනය කිරීමට දෙපාර්ශවය එකඟතාවය පලකර තිබූ නමුදු 2015 ජුනි මාසය වනවිටත් එය සිදුවී නොතිබුණි.

**5.8 පාඩු හා හානි**

**--------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 මාර්තු 16 දින කොළඹ ජාතික කෞතුකාගාරයේ සිදු වූ සොරකම නිසා අස්ථානගතව තිබූ කෞතුක භාණ්ඩ ප්‍රමාණය 221 ක් වූ අතර එම භාණ්ඩවල වටිනාකම රු.4,440,140 කට තක්සේරු කර තිබුණි. ඉන් භාණ්ඩ 94 ක් මුල් තත්ත්වයෙන්ම ද භාණ්ඩ කොටස් හා ගල් වශයෙන් 57 ක් ද නැවත හමු වී තිබුණු අතර අනෙකුත් භාණ්ඩ කපා, තලා දැමීම නිසා විනාශයට පත්ව තිබුණි. 2015 ජුනි මාසය වන විටත් අධිකරණමය ක්‍රියාමාර්ග අවසන්ව නොතිබුණි.

(ආ) කොළඹ කෞතුකාගාරයේ ප්‍රධාන තරප්පු පෙළෙහි වම්පස කොටස 2013 මාර්තු 28 දින කඩාවැටීම නිසා අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් 2014 වර්ෂයේදී

ගොඩනැගිල්ලේ බිත්ති හා වහලයේ අළුත්වැඩියා කටයුතු නිසාත් කෞතුකාගාරයේ මැදිරි කිහිපයක් වසා තැබීමට සිදුවීම නිසා නියමිත ප්‍රවේශපත්‍ර ගාස්තුවෙන් අඩක් පමණක් අයකිරීමට සිදු වී තිබුණි. මේ නිසා 2012 වර්ෂයේ නරඹන්නන්ගේ සංඛ්‍යාව 219,161 සිට 2014 වර්ෂයේදී 250,333 දක්වා ඉහල අගයක් ගෙන තිබුණු නමුත් කෞතුකාගාර ආදායම රු.16,646,570 සිට රු.12,357,560 දක්වා පහත වැටී තිබුණි.

**5.9 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

2014 නොවැම්බර් 16 දින රාත්‍රියේ කෞතුකාගාරයේ ඉහල මහලේ පිහිටි රෙදිපිළි හා මැටි භාණ්ඩ මැදිරියේ ප්‍රවේශ දොරගුළු කඩා තිබුණි. 2012 වර්ෂයේ සිදු වූ සොරකමෙන් පසු කෞතුකාගාර භූමියේ විශේෂ ආරක්ෂක වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර තිබියදී මෙම අනවසර ඇතුළුවීම සිදුව තිබුණු අතර 2015 ජුනි මාසය වන විටත් එයට වගකිව යුතු අයෙකු හඳුනා ගැනීමට ආරක්ෂක අංශ අසමත් වී තිබුණි.

**5.10 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 11 | 06 | 05 |
| (ii) තෘතියික මට්ටම | 04 | 01 | 03 |
| (iii) ද්විතියික මට්ටම | 119 | 71 | 48 |
| (iv) ප්‍රාථමික මට්ටම | 219 | 193 | 26 |
| **එකතුව** | **353** | **271** | **82** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 82 ක් පිරවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. මෙම පුරප්පාඩු තුළ අතිරේක අධ්‍යක්ෂ තනතුරු දෙකක්ද, සහකාර අධ්‍යක්ෂ තනතුරු 06 න් 03 ක් ද, කෞතුකාගාර අධිකාරි තනතුරු 10 න් 05 ක් ද විය.

(ආ) කොළඹ කෞතුකාගාරයේ 2012 මාර්තු 16 දින සිදු වූ කෞතුක භාණ්ඩ සොරකම සහ 2014 නොවැම්බර් 16 දින රාත්‍රියේ සිදු වූ අනවසර ඇතුළුවීම වැනි සිදුවීම් මත කෞතුකාගාරයේ ආරක්ෂාව පිළිබඳ ගැටළු පැවතියද, 2013 මැයි 23 දින අනුමත කර තිබූ ප්‍රධාන ආරක්ෂක නිලධාරී තනතුර හා ආරක්ෂක සහායක තනතුරු 03 ක් සඳහා

බඳවා ගැනීම් 2014 දෙසැම්බර් 31 දින වන විටත් සිදුකර නොතිබුණි.

6. **ශීර්ෂ 209 - ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව.**

-----------------------------------------------------------

**6.1 ගිණුම් ඉදිරිපත් කිරීම**

---------------------

2014 නොවැම්බර් 04 දිනැති අංක 238/2014 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව විෂය අංක 20701 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශනය 2014 අප්‍රේල් 30 දිනට ප්‍රථම විගණනයට ඉදිරිපත් කළයුතු වුවත්, එය මාස 02 ක ප්‍රමාදයකින් පසුව 2015 ජුනි 29 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**6.2 අයවැය විචලනය**

-------------------

වැය විෂයයන් 05 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 27 සිට සියයට 65 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**6.3 පොදු තැන්පත් ගිණුම**

----------------------

වර්ෂ 02 ක් ඉක්මවූ එකතුව රු.9,645,433 ක් වූ තැන්පතු 13 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**6.4 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම.**

---------------------------------------

විෂය අංක 20901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.290,039 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**6.5 වත්කම් කළමනාකරණය**

--------------------------

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.**

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුව සඳහා ගොඩනැගිලි පුළුල් කිරීම යටතේ රු.638,329,722 ක් වැයකර වර්ග මීටර් 6836 ක් වූ මහල් 04 කින් සමන්විත නව ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. එම ගොඩනැගිල්ල 2012 නොවැම්බර් මාසයේදී විවෘත කර තිබුණි. 2015 ජුනි මාසය වන විටත් කාර්යාල කටයුතු

සඳහා අවශ්‍ය ලී බඩු උපකරණ, පරිගණක උපකරණ හා **Mobile Racking System** මිලදී නොගැනීම නිසා ගොඩනැගිල්ල ඌන උපයෝජිතව පැවතුණි.

(ii) 2014 ඔක්තෝබර් මාසයේදී රු.4,788,000 ක් වැයකර Micro Reader Machines 03 ක් මිලදී ගෙන තිබුණි. පැරණි Reader Machines 04 ක් ද දෙපාර්තමේන්තුව සතුව පවතින අතර එම යන්ත්‍ර ක්‍රියා කරවීමට ශ්‍රව්‍යදෘශ්‍ය කාර්මික නිලධාරියෙක් යටතට හෝ වගකිවයුතු නිලධාරියෙකු භාරයට පත්කර නොතිබුණි.

(iii) 2014 දෙසැම්බර් 31 දින රු.2,757,000 ක් වැයකර ස්කෑනර් යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි. පැරණි යන්ත්‍රයක් දෙපාර්තමේන්තුව සතුව පවතින අතර එය ක්‍රියාත්මක කරවීමට පුහුණුව ලත් නිලධාරින් යටතට හෝ වගකිව යුතු නිලධාරියෙකු භාරයට පත්කර නොතිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම.**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව 2015 ජුනි 30 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 6.6 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | . |
| (i) මුදල් රෙගුලාසි 427 | දෙපාර්තමේන්තුවේ පොත් අනුව පොදු තැන්පත් ගිණුමේ ශේෂයයන් භාණ්ඩාගාරයේ පොත් සමඟ සැසඳිය යුතු වුවත්, එසේ සැසැඳිමක් සිදු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ii) මුදල් රෙගුලාසි 715(2), 751(1) හා 756 | ගබඩා භාරකරු තනතුර සඳහා නිලධාරියෙක් විධිමත් ලෙස පත්කර නොතිබූ අතර තොග පොත් නඩත්තුව හා ගබඩාවේ භාණ්ඩ සමීක්ෂණ 2013 වර්ෂය සඳහා සිදුකර නොතිබුණි. |

**(ආ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ**
**------------------------**

| | |
|---|---|
| 1994 අගෝස්තු 16 දිනැති අංක 96 දරන චක්‍රලේඛයේ 8 ඡේදය | අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් ක්‍රමවත් පාලන ගිණුමක් පවත්වා නොතිබුණි. |

## 6.7 කාර්යසාධනය
**----------------**

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**
**-----------------------------------------------**

නව ගොඩනැගිලි පරිශ්‍රයේ විවිධ අංශ සඳහා අවශ්‍ය ලී බඩු උපකරණ අයිතම 285 ක්, පරිගණක අයිතම 105 ක් සහ මහල් හතර සඳහාම අවශ්‍ය Mobile Racking System මිලදී ගැනීම සඳහා උපදේශාත්මක සේවා ලබා ගැනීමට ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳව මධ්‍යම උපදේශන කාර්යාංශය වෙත පවරා තිබුණි. මුළු ඇස්තමේන්තුගත මුදල වූ රු.මිලියන 373.5 න් උපදේශන ගාස්තුව වූ සියයට 6 න් සියයට 50 ක මුදල වූ රු.මිලියන 12.5 ක( එකතු කළ අගය මත බදු සමඟ) මුදල්ද 2014 ජුලි 04 දින ගෙවා තිබුණි. නමුත් 2015 ජුනි 30 දින වන විටත් උපකරණ මිලදී ගැනීමට අදාල ලංසු කැඳවීමේ දැන්වීම් පලකිරීම හෝ සිදුකර නොතිබුණි.

**(ආ) සැලැසුම් කිරීම.**
**----------------**
**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම.**
**-----------------------------------------------------------**

පහත සඳහන් අවස්ථාවලදී ක්‍රියාකාරී සැලැස්මට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

(i) අධිලේඛන වෙළුම් 36 ක් සංරක්ෂණය කිරීමට සැලැසුම් කර තිබුණද, 2014 වර්ෂයේදී අධිලේඛන වෙළුම් 21 ක් පමණක් සංරක්ෂණය කර තිබුණි.

(ii) ප්‍රදර්ශන හා පාසල් දැනුවත් කිරීමේ වැඩසටහන් යටතේ ප්‍රදර්ශන ඉලක්කයන් ඉටුකරගෙන තිබුණද, තෝරාගත් දිස්ත්‍රික්කවල සැලැසුම් කළ දැනුවත් කිරීමේ වැඩසටහන් 02 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(iii) ලේඛන කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ ඡන්ද නාමලේඛන වෙළුම් 380 ක් අංකිත කිරීමට නියමිතව තිබූ අතර එයින් ඡන්ද නාමලේඛන 228 ක් පමණක් අංකිත කර තිබුණි.

(iv) රාජ්‍ය ආයතනවල ලේඛන ආබද්ධ කරගැනීම යටතේ 2014 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ ආබද්ධ කරගැනීමට බලාපොරොත්තු වන ලේඛන ප්‍රමාණාත්මකව දක්වා නොතිබුණි. මේ නිසා වර්ෂය තුළ අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගත් බව තහවුරු නොවුණි.

## 6.8 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) ගැලපුම් කළයුතු ශේෂ

දෙපාර්තමේන්තු විසින් 2014 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| ගැලපුම් පිළිබඳ විස්තරය | | කාල විශ්ලේෂණය | | | එකතුව |
|---|---|---|---|---|---|
| | | මාස 06 ට වැඩි වර්ෂ 01 ට අඩු | වර්ෂ 01 ට වැඩි වර්ෂ 03 ට අඩු | වර්ෂ 03 ට වැඩි | |
| | | රු. | රු. | රු. | රු. |
| (i) | උපලබ්ධි නොවූ තැන්පතු | 1,377 | 231,061 | 69,409 | 301,847 |
| (ii) | නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 118,111 | 1,050,443 | 842,508 | 2,011,062 |
| (iii) | හඳුනා නොගත් හර | 1,155,208 | 1,183,848 | 1,791,293 | 4,130,349 |
| (iv) | හඳුනා නොගත් බැර | 121,455 | 2,402,204 | 1,022,313 | 3,545,972 |

### (ආ) නිවැරදි නොකරන ලද බැංකු ගනුදෙනු

ඉකුත් වර්ෂයේ වාර්තාවෙන්ද පෙන්වා දී තිබුණද නිවැරදි නොකරන ලද බැංකු ගනුදෙනු 2014 දෙසැම්බර් මාසය සඳහා වු බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කිරීමේදී ද නිරීක්ෂණය විය.

(i) 2011 සහ 2012 වර්ෂවල නිකුත් කළ නමුත් බැංකුව වෙත ඉදිරිපත් නොකළ චෙක්පත් 2 ක එකතුව රු.681,594 ක් විය.

(ii) 2013 වර්ෂයේ තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පතක වටිනාකම රු.152,900 ක් විය.

(iii) 2008 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා හඳුනා නොගත් ගෙවීම් 13 ක එකතුව රු.4,007,628 ක් විය.

(iv) 2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා හඳුනා නොගත් ලැබීම් 6 ක එකතුව රු.3,273,232 ක් විය.

## 6.9 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

පහත සඳහන් අකාර්යක්ෂමතා නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(අ) 2013 වර්ෂයේ මුද්‍රණය කර තිබූ Alphabetical Index, Dutch Sinhalese Dictionary හා Dutch Political Council පොත් තුනෙහි පිටපත් පිළිවෙලින් 500, 1,000 හා 500 බැගින් මුද්‍රණය කිරීම සඳහා රු.1,383,000 ක් වැයකර තිබුණි. මෙම පොත්වල අලෙවිය වර්ෂ 02 ක් ඉකුත් වූ පසුව සියයට 25 ට අඩු මට්ටමක පැවති අතර 2015 ජුනි මාසය වන විට ඉතිරි පොත් තොග පිළිවෙලින් 392, 870 හා 378 බැගින් වූ අතර එම ඉතිරි තොගයේ මුද්‍රණ පිරිවැය රු.1,115,520 ක් විය.

(ආ) ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ නව ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සවය වෙනුවෙන් 2013 වර්ෂය අවසානයේ "Sri Lanka Reflections of History" පොතෙන් පොත් 1000 ක් මුද්‍රණය කර තිබූ අතර එයින් මුද්‍රණ පිරිවැය රු.520,643 ක් වූ පොත් 522 ක් 2015 ජුලි මාසය වන විටත් ඉතිරි වී තිබුණි.

(ඇ) 2011 හා 2012 වර්ෂවලදී තොග පොත්වලට ඇතුළත් කර තිබූ අලෙවිය ඉතා අඩු මට්ටමක පැවති පොත් වර්ග 05 කට අයත් පිටපත් 3126 ක වටිනාකම රු.2,061,628 ක් විය. අලෙවි කළ නොහැකි තත්ත්වයට පත්ව තිබූ තවත් පොත් වර්ග 02 කට අයත් පිටපත් 192 ක් හා 1426 ක් ඉතිරිව තිබුණි.

## 6.10 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

---------------------------------------------------

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 06 | 03 | 03 |
| (ii) | තෘතියික මට්ටම | 41 | 09 | 32 |
| (iii) | ද්විතියික මට්ටම | 133 | 53 | 80 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 74 | 50 | 24 |
| | **එකතුව** | **254** | **115** | **139** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 139 ක් පිරවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. අනුමත කාර්යමණ්ඩලයෙන් අඩකට වඩා පුරප්පාඩුව පවතින අතර අත්‍යවශ්‍ය දෙපාර්තමේන්තුගත තනතුරු රැසක්ද පුරප්පාඩුව පැවතුණි.